අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)

# ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

## විෂය නිර්දේශය

(2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

ආගම් දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# 1.0 විෂය හැඳින්වීම.

දහමින් තොරව සදාචාරසම්පන්න සමාජයක් කිසිසේත් බලාපොරොත්තු විය නොහැකි ය. දහම් අවබෝධය අත්‍යවශ්‍ය කරුණක් වන්නේ එහෙයිනි. එබඳු ආගමික අවබෝධයක් සහිත ජීවිතය ඉතාමත් අගනේය. එමගින් නිතැතින්ම සදාචාරසම්පන්න සමාජයක් ද බිහි වේ.

විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ මෙතෙක් විෂය පාදකව ගොඩ නැගු විෂයමාලා එම දර්ශනයෙන් මිදී නිපුණතා පාදක විෂයමාලා දර්ශනයක් සහිතව ගොඩනගා ඇත. ඒ අනුව කිතුනුවකු තම ධර්මය මගින් කවර ආගමික නිපුණතා තම ජීවිතයට එක් කර ගත යුතු දැයි මනාව හඳුනාගත යුතුව ඇත. ඒ ඒ නිපුණතා සංවර්ධනයට අදාළ කර ගත හැකි විෂය සන්ධාරය හඳුනාගෙන ඇති ආකාරය අවධානයට යොමු විය යුතුය. එයට උචිත ඉගෙනුම් ක්‍රමෝපා සහතික කරන පංති කාමර ක්‍රියාවලියක් ද හඳුන්වා තිබේ.

6 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වාම එකම තේමාවක් හෝ තේමා සමූහයක් පාදක කොටගෙන 6 වන ශ්‍රේණියේ දී ලිහිල් හැඳින්වීම්වලට ද, 11 වන ශ්‍රේණිය වන විට තේමාවලින් ඉගැන්වෙන දේ පිළිබඳ යම්කිසි පරිණතභාවයක් කරා ගෙන එන ආකාරයෙන් විෂය නිර්දේශය සකස් කර ඇත්තේ ද එහෙයිනි.

අප දන්නා තරමින් 11 වන ශ්‍රේණියේ ඉගෙනුම අවසන් කිරීමත් සමඟ විධිමත් ලෙස බොහෝ සිසුන්ගේ ආගම ඉගෙනීම ද අවසන් වෙයි. එහෙත් උසස් පෙළ දක්වා ආගම විෂය යටතේ ක්‍රිස්තියානි ධර්මය හා ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය අවස්ථාව ලබා ගන්නා සිසුන් හට වඩා පරිණත වූ තත්ත්වයක් හා ජීවිත පුහුණුවක් කරා යොමු කරන්නට හැකි වන ආකාරයෙන් සකස් වූ විෂය නිර්දේශයක් ඔස්සේ මූලික වශයෙන් දේව වචනය, සභා ඉතිහාසය, සභා ඉගැන්වීම් ආදිය හා වෙනත් බොහෝ දේ පිළිබඳ ඉතා ගැඹුරු හා පුළුල් නිපුණතාවක් ලබා ගැනීමට අවකාශය ලැබේ. විශ්ව විද්‍යාල අධ්‍යාපනය හෝ ඉන් ඔබ්බට ගමන් කරන සිසුවා මුහුණ දෙන ජීවිත අභියෝග ඉදිරියේ මනා පරිණතභාවයකින් කටයුතු කරන්නට එය රුකුලක් වනු ඇත.

ජීවිතයේ එක් අදියරක් අවසන් කොට තවත් අදියරකට පිය එසවීමට බලා සිටින මෙම සිසු දරුවනට දහම ජීවිතයට ඒකාබද්ධ කර ගැනීමට සහාය වීමේ අපේක්ෂාවෙන් මෙම විෂය නිර්දේශය සැකසී තිබේ.

## 2.0 විෂය නිර්දේශයේ අරමුණු

1. කිතු දහමේ මුල් යුගයේ ඉතිහාසය විස්තර කරමින් බටහිර යුරෝපීය රටවල කිතු දහම පැතිරීම පිළිබඳ කරුණු සොයා බලා ශිෂ්ටාචාරයේ වටිනාකම් වැළඳ ගනියි.

2. තාපස දිවිය පිළිබඳව හා සභාවේ පැවිදි නිකායන් හා ව්‍යාපාර පිළිබඳ කරුණු අධ්‍යයනය කර සභාවේ අභිවෘද්ධිය සඳහා කැප වෙයි.

3. පසු මධ්‍යතන යුගයේ සභා ප්‍රතිසංස්කරණ ඇතිවීමට හේතු වූ කරුණු වටහා ගෙන ප්‍රොතෙස්තන්තවාදයේ නැගීම හා එහි ස්වභාවය විස්තර කර සභා එකමුතුවට මග පාදයි.

4. සුභාරංචියේ විශ්වීයභාවය ඇත පෙරදිග රටවල ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය හදාරමින් අවබෝධ කරගෙන ඉන්දියාවේ කිතුනු සභාව පිළිබඳ අධ්‍යයනයෙන් සභා සම්ප්‍රදායන්ගේ විවිධත්වය ජීවිතයට සම්බන්ධ කර ගනියි.

5. ශ්‍රී ලංකාවේ කිතුනු සභාවේ ආරම්භය ද යුරෝපීයන්ගේ පැමිණීමෙන් ආරම්භ වූ කිතුනුවන්ගේ ස්වභාවය ද තේරුම් ගෙන කිතුනු දිවිය සරු කර ගනියි.

6. දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ සංස්කෘතිකමය හා සාමාජීය සංවර්ධනය සඳහා වූ යෝජනා ක්‍රියාවට නංවයි.

7. කිතුනු සභා නායකයින්ගේ සමාජ සංස්කෘතික ප්‍රගතිය සඳහා වූ ඉගැන්වීම ජීවිතයට ආදේශ කර ගනිමින් විවිධ ආගමික කොටස් සමඟ සහජීවනයෙන් ජීවත් වෙයි.

8. ශිෂ්ටාචාරයේ සංස්කෘතික ස්වභාවය අධ්‍යයනය කර කිතුනු ශිෂ්ටාචාරයකට මූලික වූ අනෙක් ශිෂ්ටාචාරයන් හා සමාජ පසුබිම තුළින් ජීවිතය සරු කර ගනියි.

9. කිතුනු දහමේ මූලාශ්‍ර මුල් යුගයේ සභාවේ සමාජ සංස්කෘතික ලක්ෂණ හා නව යුරෝපීය ශිෂ්ටාචාරයක් ගොඩ නැගීමට පැවිදි නිකායවල දායකත්වය සොයා බලා නව ජීවන ගමනකට අවතීර්ණ වෙයි.

10. කිතුනු සංස්කෘතියක් බිහි කිරීමේ ලා ජනවන්දනාවේ දායකත්වය හා ඒ සඳහා දේශීය ජන වන්දනාවක් බිහි කිරීමේ අවශ්‍යතාව ක්‍රියාවට නංවයි.

11. සභාවේ අධ්‍යාපනික සේවාව විමසා බලමින් නව චින්තනයකට මග හෙළි කළ කිතුනු චින්තනය හඳුනාගෙන කලා විෂයයන්හි උන්නතිය උදෙසා සභාවේ දායකත්වය හඳුනාගෙන විවිධ සේවාවන් සඳහා තම දිවිය කැප කරයි.

12. අධ්‍යාපනය නගා සිටුවීමේලා සභාවෙන් ලද දායකත්වය වටහාගෙන තම ජීවිතය අධ්‍යාපන සේවාව සඳහා කැප කරයි.

13. ශ්‍රී ලාංකේය සමාජයේ සුභ සාධනය හා මානව හිමිකම් වෙනුවෙන් සභාවේ දායකත්වය දැන පුරවැසි යුතුකම් ඉටු කරයි.

14. ශ්‍රී ලාංකේය සමාජය තුළ කලාවේ උන්නතිය සඳහා වු කිතුනු දායකත්වය වටහාගෙන තම හැකියා සමාජයට එක් කරයි.

15. ශ්‍රී ලාංකේය කිතුනුවන්ගේ පැවැත්ම විමර්ශනය කර එම පැවැත්ම තුළ මාංශගත වෙයි.

## විෂය නිර්දේශය පාසල් වාර වශයෙන්
## බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 12 | 1 | 1.1 - 2.1 | 105 |
| | 2 | 2.2 - 3.3 | 95 |
| | 3 | 4.1 - 5.2 | 100 |
| 13 | 1 | 6.1 - 7.1 | 130 |
| | 2 | 7.2 - 9.1 | 96 |
| | 3 | 9.2 - 10.3 | 74 |

# 3.0 විෂය නිර්දේශය

## 3.1 - 12 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 1.0 කිතු දහම පිළිබඳ හර දැක්මක් ලබා ගැනීම සඳහා කිතුනු ශිෂ්ටාචාරයේ වටිනාකම් වැළඳ ගනියි. | 1.1 කිතුනු දහමේ මුල් යුගයේ ඉතිහාසය විස්තර කරයි. | • ශුද්ධාත්ම ආගමනය හා සභාව බිහිවීම.<br>• හැඳින්වීම<br>• ජෙරුසෙලම් සභාව<br><br>• පෙරදිග රටවල් කරා සභාව ව්‍යාප්ත වීම<br>• ස්තේවන් තුමාගේ මරණය<br>• ශු. පාවුළු තුමන්ගේ ධර්මදූත ගමන්<br>• පීඩන හා සභාවේ ව්‍යාප්තිය<br>• රෝම අධිරාජ්‍ය තුළ කිතුනු සභාව<br>• රෝම අධිරාජ්‍ය තුළ ආගමික නිදහස<br>• වේද භේද හා විශ්වාස වර්ධනය | 52 |
| | 1.2 බටහිර යුරෝපීය රටවල කිතුනු දහම පැතිර්ම පිළිබඳව කරුණු අධ්‍යයනය කරයි. | • කිතුනු ධර්මදූතවරු<br>• යුරෝපීය ගෝත්‍රයන් කිතුනු දහම වැළඳ ගැනීම.<br>• යුද්ධ හා ආක්‍රමණ | 26 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 2.0 තාපස හා පැවිදි දිවිය මගින් අධ්‍යාත්මික හා සංස්කෘතියේ වර්ධනය සඳහා වූ දායකත්වය අධ්‍යයනය කොට සභාවේ අභිවෘද්ධිය සඳහා කැපවෙයි. | 2.1 තාපස දිවිය පිළිබඳව හැදෑරීමෙන් සභාවේ අධ්‍යාත්මික දිවි මගට පිවිසෙයි. | • කිතුනු තාපස ක්‍රමයේ ආරම්භය<br>• කාන්තාරයේ පියවරු, ආශ්‍රමික ජීවිතය හා තාපස නීති බිහිවීම<br>• බෙනදිකානු තාපස ක්‍රමය හා ධර්මදූතික සේවය<br>• ශිෂ්ටශියන් තාපසයෝ<br>• ක්ලුනි තාපසාරාමය | 27 |
| | 2.2 සභාවේ අධ්‍යාත්මික නවෝදයකට හේතුවූ පැවිදි නිකායන් හා ව්‍යාපාර පිළිබඳව කරුණු අධ්‍යයනය කරයි. | • යාචක නිකායන් හා දිළින්දන්ගේ ව්‍යාපාර ඇති වීමට හේතු වූ පසුබිම<br>• වැල්දෙන්සියානුවෝ<br>• ප්‍රැන්සිස්කානු නිකාය<br>• දොමිනිකානු නිකාය | 22 |
| 3.0 පසු-මධ්‍යතන යුගයේ සභාව තුළ වූ ප්‍රතිසංස්කරණවලදී සභාව විවිධ කොටස් වලට වෙන්වීමට හේතු වූ ආකාරය සොයා බලා සභා එකමුතුවට මග පාදයි. | 3.1 පසු-මධ්‍යතන යුගයේ සභා ප්‍රතිසංස්කරණ ඇතිවීමට පාදක වූ හේතු වටහාගෙන සභාව නිසි මග ගැන්වීමට දායක වෙයි. | • සභා ප්‍රතිසංස්කරණයේ ආගමික පසුබිම<br>  • අධ්‍යාත්මික පිරිහීම<br>  • අධ්‍යාත්මිකත්වය පිරිහීමට හේතු<br>  • සභාව තුළවූ බෙදීම් | 22 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
| --- | --- | --- | --- |
| | 3.2 ප්‍රොතෙස්තන්ත්‍රවාදයේ නැගීම හා එහි ස්වභාවය විස්තර කරයි. | • සභා ප්‍රතිසංස්කරණයේ සමාජීය හා දේශපාලන පසුබිම<br>  • නව ප්‍රාන්ත රාජ්‍ය බිහිවීම.<br>  • ලෞකිකත්වය ඇතිවීම<br>• මාටින් ලූතර්, කැල්වින් , ස්විංග්ලින් හා තෝමස් මුන්ට්සර්ගේ ප්‍රතිසංස්කරණය<br>• ඇන්ග්ලිකානු සභාව බිහිවීම<br>• බටහිර සභාව තවදුරටත් බෙදීයාම, ජෝන් වෙස්ලි හා විලියම් කේරිගේ ප්‍රතිසංස්කරණ | 22 |
| | 3.3 ප්‍රතිසංස්කරණ හේතුවෙන් කතෝලික සභාව තුළ නවෝදයකට මග පැදූ ආකාරය දැන සභාව තුළ ක්‍රියාකාර් ලෙස දායක වෙයි. | • කතෝලික සභාව තුළ ප්‍රතිසංස්කරණ<br>• සභා ධර්මදූත සේවයේ නව ප්‍රවණතා<br>• සභා නවෝදයකට දායක වූ පැවිදි නිකායන් හා ඒවායේ ධර්මදූත සේවාව<br>  • ජේසු නිකාය<br>  • වින්සෙන්තියානු නිකාය<br>  • කාර්මෙල් නිකාය<br>  • කපුචීන් ප්‍රැන්සිස්කානු නිකාය | 29 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 4.0 ආසියාව තුළ කිතුනු ශිෂ්ටාචාරයේ ව්‍යාප්තිය සහ එහි බලපෑම ක්‍රමානුකූලව විමර්ශනය කොට ආසියාතික සභාවක් බිහි කිරීමට කටයුතු කරයි. | 4.1 ශුභාරංචියේ විශ්වීයභාවය ඈත පෙරදිග රටවල ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය හැදෑරීමෙන් අධ්‍යයනය කරයි. | • නැගෙනහිර හා මධ්‍යම ආසියාතික රටවල කිතුනු සභා ව්‍යාප්තිය<br>• චීනය<br>• මැතිව් රිචි පියතුමාගේ ධර්මදූත ක්‍රමය<br>• කොරියාව, ජපානය හා පිලිපීනය | 15 |
| | 4.2 ඉන්දියාවේ කිතුනු සභාව පිළිබඳව අධ්‍යයනයෙන් සභා සම්ප්‍රදායන්ගේ විවිධත්වය පැහැදිලි කරයි. | • ඉන්දියාවේ පෙරදිග කිතුනු සභා<br>• සීරෝ මලබාර්<br>• සීරෝ මලංකාරා<br>• ඕර්තොඩොක්ස්<br>• ශා. තෝමස් ක්‍රිස්තියානීහු<br>• ලතින් සභාවේ ආරම්භය<br>• ප්‍රොතෙස්තන්ත කිතුනු සභා | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 5.0 ලංකාවේ කිතුනු ශිෂ්ටාචාරය පිළිබඳව හඳාරා ශ්‍රී ලාංකික කිතුනුවකු ලෙස ජීවත් වෙයි. | 5.1 ශ්‍රී ලංකාවේ කිතුනු සභාවේ ආරම්භය පිළිබඳ කරුණු සොයයි. | • අනුරාධපුර යුගයේ ක්‍රිස්තියානීහු<br>• නූතන ගවේෂණයන්හි අනාවරණ | 06 |
| | 5.2 යුරෝපීයයන්ගේ පැමිණීමෙන් ආරම්භ වූ කිතුනු සභාවේ ස්වභාවය පිළිබඳ කරුණු හදාරයි. | • පෘතුගීසි යුගයේ කිතුනු සභාව<br>• ප්‍රැන්සිස්කානු ධර්මදූතවරු<br>• මන්නාරමේ කිතුනු ප්‍රාණ පරිත්‍යාගීවරු<br>• මුහුදු බඩ කිතුනු ව්‍යාප්තිය<br><br>• ලන්දේසි යුගයේ කිතුනු සභාව<br>• සභා පීඩනය<br>• ඕලන්ද රෙප්‍රමාදු සභාව<br>• භාග්‍යවත් ජුසේ වාස් පියතුමා හා ඔරතෝරියානු ධර්මදූත සේවාව<br><br>• බ්‍රිතාන්‍ය යුගයේ කිතුනු සභාව<br>• විවිධ කිතුනු නිකායන්ගේ ව්‍යාප්තිය<br>• ආගමික නිදහස<br>• විදේශීය ධර්මදූතවරු | 54 |

## 3.2 - 13 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 6.0 කිතුනු ශිෂ්ටාචාරයක් ගොඩ නැගීමට මූලික වූ ශිෂ්ටාචාරයන් අධ්‍යයනය කොට යහපත් ජීවිත පැවැත්මකට පසුබිම සකසා ගනියි. | 6.1 ශිෂ්ටාචාරයේ ස්වභාවය අධ්‍යයනය කරයි. | • ශිෂ්ටාචාරය නිර්වචනය කිරීම<br>• ශිෂ්ටාචාරයේ ලක්ෂණ හඳුනා ගැනීම | 04 |
| | 6.2 කිතුනු ශිෂ්ටාචාරයට පදනම සකසන ශිෂ්ටාචාරයන් පිළිබඳව ක්‍රමානුකූලව විමසා බලයි. | • අපරදිග ආසියාතික හා සෙමිටික් ශිෂ්ටාචාරයන්<br>• නයිල් ගංගා නිම්න ශිෂ්ටාචාරය<br>• යුප්‍රටීස් හා ටයිග්‍රීස් ගංගා නිම්න ශිෂ්ටාචාරය<br>• බයිබලීය භූගෝලීය පසුබිම<br>• ඓතිහාසික පසුබිම<br>• නික්මයාම<br>• ජන නායකයෝ<br>• රජවරු<br>• රාජ්‍ය දෙකඩවීම<br>• විප්‍රවාසය<br>• අපර විප්‍රවාසී යුගය | 45 |
| | 6.3 කිතුනු දහම බිහිවූ සමාජ පසුබිම ගවේෂණය කරයි. | • පලස්තීනයේ දේශපාලන හා සමාජීය පසුබිම<br>• රෝම පරිපාලන ක්‍රමය<br>• හෙරෝද්ගේ පාලන ක්‍රමය<br>• නායක පූජකවරු හා මන්ත්‍රණසභාව | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
| --- | --- | --- | --- |
| 7.0 කිතුනු ශිෂ්ටාචාරයක් බිහිවීම තුළ සමාජ සංස්කෘතික ක්ෂේත්‍රයේ සිදුවූ වෙනස්කම් හරහා ජීවිත වෙනසක් කරා ගමන් කරයි. | 7.1 කිතුනු දහමේ මූලාශ්‍ර අධ්‍යයනය කර වත්මන් සභාවේ වර්ධනයට ඒවා ආදර්ශ කොට ගනියි. | • ක්‍රිස්තු කාලීන ජුදා සමාජයේ සංස්කෘතික හා ආගමික සම්ප්‍රදාය<br>• ජුදා සමාජ ක්‍රමය හා සමාජ පන්ති<br>• ජුදා ආගමික සිරිත් විරිත්<br><br>• කිතුනු ශිෂ්ටාචාරයේ පදනම වූ ක්‍රිස්තුන් වහන්සේ<br>• ක්‍රිස්තුන් වහන්සේ යනු කවරෙක් ද?<br>• ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම් (මතෙව් 5- 7වන පරිච්ඡේද ඇසුරින්)<br><br>• අපෝස්තලික සම්ප්‍රදාය හා එහි ඉගැන්වීම්<br>• ශුද්ධාත්ම ආගමනය<br>• ඩීඩාකේ<br>• මුල් ක්‍රිස්තියානීහු<br>• නව සමාජ ක්‍රමයක උදාව<br>• ශු. පාවුළු තුමාගේ ජීවිතය<br>• කිතුනු සභා පිහිටුවීම | 66 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| | 7.2 පෙර අපර දෙදිග ව්‍යාප්ත වූ සභාවේ මුල් යුගයේ සිදුවූ සමාජ ප්‍රවණතා ලක්ෂණ විමර්ශනය කරයි. | • ප්‍රධාන ඉගැන්වීම්<br>- දේව අනුග්‍රහය<br>- ක්‍රිස්තුස් වහන්සේගේ නායකත්වය<br>- ක්‍රිස්තුස් වහන්සේගේ බැහැපත්කම<br>- උත්ථානය<br>- දෙවන පැමිණීම<br>• ශීල ධාර්මික කරුණු<br>- පවුල් දිවිය<br>- සහෝදරත්වය<br>- එකමුතුකම<br>- ශුද්ධාත්ම දීමනා හා ඵල<br>• නව චින්තනයක උදාව<br>• කිතුනු විද්‍යා පීඨ<br>• ඇලෙක්සැන්ඩ්‍රියානු<br>• අන්තියෝකියානු<br>• ග්‍රීක රෝම සංස්කෘතියේ නව ප්‍රවණතා<br>• මුල් යුගයේ කිතුනු චින්තකයෝ සහ ධර්මධරයෝ<br>• බටහිර යුරෝපීය ගෝත්‍රිකයන්ගේ බලපෑම | 22 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| | 7.3 නව යුරෝපීය ශිෂ්ටාචාරයක් ගොඩ නැගීමට පැවිදි නිකායන්වල දායකත්වය සොයා බලයි. | • බෙනදිකානු ආදර්ශය, යාච්ඤාව හා වැඩ කිරීම.<br>• තාපස ගම්මාන හා දුගී බවේ ආදර්ශය | 07 |
| 8.0 විශ්ව සමාජයේ ප්‍රගතිය උදෙසා සභාවේ සමාජ සංස්කෘතික දායකත්වය අධ්‍යයනය කරමින් කිතුනු වගකීම් ඉටු කරයි. | 8.1 සභාවේ අධ්‍යාපනික සේවාව විමසා බලා තම දැනුම වැඩි දියුණු කර ගනියි. | • අධ්‍යාපනය සඳහා සභාවේ කැපවීම<br>  • නාගරික හා ආසන දෙව්මැදුරු ආශ්‍රිත පාසල්<br>  • තාපසාරාම අධ්‍යාපනය<br>• විශ්ව විද්‍යාලයන්ගේ ආරම්භය<br>  • බොලොඤ්ඤ සහ පැරිස් විශ්ව විද්‍යාල<br>  • ඔක්ස්පර්ඩ්, කේම්බ්‍රිජ් සහ සලමන්කා විශ්ව විද්‍යාල | 16 |
| | | • විද්‍යාව හා තාක්ෂණික දියුණුව උදෙසා කිතුනු විද්‍යාඥයන්ගේ දායකත්වය | 08 |
| | 8.2 නව චින්තනයකට මග හෙළි කළ කිතුනු චින්තකයන් හඳුනා ගනියි. | • දර්ශනවාදීහු<br>  • ශු. තෝමස් ඇක්වයිනස් මුනිතුමා | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| | | ● දේවධර්ම ශාස්ත්‍රඥයෝ<br>• ශු. අගොස්තීනු මුනිතුමා | |
| | 8.3 කලා ශිල්පයන්හි උන්නතිය උදෙසා සභාවේ දායකත්වය හඳුනාගෙන නිර්මාණශීලී | ● කලාවේ උන්නතිය උදෙසා සභාවේ දායකත්වය<br>● ලේඛනය, ලේඛකයෝ හා සංගීතය<br>● ගෘහ නිර්මාණ කැටයම් ශිල්පය, චිත්‍ර හා මූර්ති ශිල්පය | 15 |
| 9.0 ලාංකේය සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් කිතුනු සභාවෙන් ලද දායකත්වය විස්තර කර සමාජ අභිවෘද්ධිය වෙනුවෙන් කිතුනුවකු ලෙස කටයුතු කරයි. | 9.1 අධ්‍යාපනය නගා සිටුවීමෙහිලා සභාවෙන් ලද දායකත්වය වටහා ගෙන තම අධ්‍යාපන හැකියාවන් වැඩි දියුණු කර ගනියි. | ● විදේශීය පාලන යුගයේ කිතුනු අධ්‍යාපන සේවාව<br>• පෘතුගීසි යුගය<br>• ලන්දේසි යුගය<br>• බ්‍රිතාන්‍ය යුගය<br>● නිදහසින් පසු යුගය<br>• අධ්‍යාපනය නගා සිටුවීමට පියවර<br>• පාසල් රජයට ගැනීම<br>● කිතුනු අධ්‍යාපනඥයෝ<br>• අති උතුම් එඩ්මන්ඩ් පීරිස් රදගුරු හිමිපාණෝ<br>• ගරු එස්.ජී. පෙරේරා පියතුමා<br>• ගරු පීටර් පිල්ලේ පියතුමා | 28 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| | 9.2 ශ්‍රී ලාංකේය සමාජයේ සුභ සාධනය හා මානව හිමිකම් වෙනුවෙන් සභාවේ දායකත්වය දැන පුරවැසි යුතුකම් ඉටු කරයි. | • ගරු එච්.එස්. ඩේවිඩ් පියතුමා<br>• ගරු ඩබ්ලිව්. දොන් පීටර් පියතුමා<br>• ගරු නල්ලූර්හි ඥානප්‍රකාශර් පියතුමා<br>• ගරු සේවියර් එස්. තනිනායගම් පියතුමා<br>• අතිගරු සිරිල් අබේනායක බිෂොප්තුමා<br>• ගරු කැනන් ආර්.එස්. දෑසේරම් පියතුමා<br>• ගරු විලී වික්‍රමසිංහ පියතුමා<br><br>• කිතුනු දයාව හා සමාජ සුභ සාධනය<br>• ශ්‍රී ලංකාව තුළ සමාජ සුභ සාධන කටයුතු<br>• මානව හිමිකම් හා සමාජ සංවර්ධනය<br>• ආරෝග්‍යශාලා සේවය<br>• මානව හිමිකම් හා සමාජ සුභසාධනයට දායකවූවෝ | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| | 9.3 ශ්‍රී ලාංකේය සමාජය තුළ කලාවේ උන්නතිය සඳහා වූ කිතුනු දායකත්වය වටහාගෙන තම හැකියා සමාජයට එක් කරයි. | • ශ්‍රී ලාංකේය කලාව උදෙසා කිතුනු දායකත්වය<br>• විවිධ කලා ක්ෂේත්‍ර<br>• ලේඛන කලාව<br>• චිත්‍ර ශිල්පය<br>• සංගීතය<br>• නාට්‍ය හා නාඩගම් කලාව<br>• සිනමා කලාව | 15 |
| 10.0 නව ලෝක ශිෂ්ටාචාරයක් බිහි කිරීමේ සහා ප්‍රයත්නයේ දී ආසියාතික හා ලාංකේය සමාජය වෙනුවෙන් සභාවේ වගකීමට දායක වෙයි. | 10.1. දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ සංස්කෘතික හා සමාජීය සංවර්ධනය සඳහා වූ යෝජනා ක්‍රියාවට නංවයි. | • දෙවන වතිකානු මන්ත්‍රණ සභාව<br>• මන්ත්‍රණ සභාවේ සමාජ ප්‍රගතිය සඳහා වූ ඉගැන්වීම්<br>• සංස්කෘතිය නඟා සිටුවීම සඳහා වූ ඉගැන්වීම්<br>• පවුල් ජීවිතය පිළිබඳ ඉගැන්වීම්<br>• සාමය සහ සහජීවනය පිළිබඳ ඉගැන්වීම් | 14 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| | 10.2 කිතුනු සහා නායකයන්ගේ සමාජ සංස්කෘතික ප්‍රගතිය සඳහා වූ ඉගැන්වීම් හා මඟ පෙන්වීම් කිතුනු ජීවිතයට ආදේශ කරගනී. | • ආසියා රදගුරු සමුළු ප්‍රකාශන (2000 - 2006)<br>• ලෝක කිතුනු සභා සම්මේලන ප්‍රකාශන (2000 - 2006)<br>• ආසියානු කිතුනු සම්මේලන ප්‍රකාශන (2000 - 2006) | 14 |
| | 10.3 විවිධ කිතුනු සභා සමඟ සහජීවනයෙන් ජීවත් වෙයි. | • සාමයික අවබෝධය හා කිතුනු සභා එකමුතුව<br>• සාමයික අවබෝධය හා කිතුනු සභා එකමුතුවට දායක වූවෝ | 10 |

# 4.0 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

දෙවි - මිනිස් සබඳතාව තුළ නිවැරදි අධ්‍යාත්මයක් ගොඩනගා ගනිමින් පරිනත බවක් කරා ගමන් කිරීමට දහම නිවැරදි ලෙස අවබෝධ කරගැනීම හා ඒ තුළින් ලැබෙන ජීවිත පන්නරය විශ්වාසයේ අත්දැකීමක් බවට පත්කර ගැනීම කිතුනු ජීවිතය තුළ ප්‍රමුඛස්ථානයක් ලබා ගනී. මෙය එකිනෙකාගේ පුද්ගලික ජීවිත අත්දැකීමක් බවට පත්කර ගනිමින් ක්‍රියාකාර කිතුනුවකු ලෙස දිවිගෙවන්නට අවැසි පසුබිම සැකසීම ශිෂ්‍යයා ලබන්නාවූ ආගමික අධ්‍යාපනයේ සැබෑ පරමාර්ථයයි.

මෙම අරමුණු සාක්ෂාත් කරගැනීමට නම් පන්ති කාමරය තුළ ලබන දැනුමට සීමා නොවී අභියෝග ජයගනිමින් විවිධ වූ යහපත් ජීවිත පුරුදු හා නිපුණතාව කරා සිසුන් මෙහෙයවන්නට අවශ්‍ය වන්නාවූ ශක්තියෙන් සන්නද්ධ වන්නට විවිධ ඉගැන්වීම් ක්‍රමෝපා ප්‍රයෝජනයට ගැනීම කාලෝචිත ය.

උසස් පෙළ අධ්‍යයන කටයුතු නිමවා වැඩ ලෝකය කරා ගමන් කරන ශිෂ්‍යයා හට නිවැරදි මග පෙන්වීම තුළ සුදුසු රැකියා අවස්ථා තෝරා ගැනීමට ද, තම යුතුකම් නිවැරදි ලෙස ඉටු කරන සාරධර්ම පිරිපුන් පුරවැසියකුගෙන් අධ්‍යාපනයක් ලැබෙන සේ සකස් වී ඇති මෙම විෂය නිර්දේශය අධ්‍යයනය කිරීමට වඩා පහසුවන ලෙස මෙම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගැනීමට දරුවන් මෙහෙයවීම ගුරුවරයා සතු මූලික වගකීමක් ද වෙයි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට පහත සඳහන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගැනීම කාලෝචිත ය.

- සංකල්ප සිතියම්
- සම්මුඛ පරීක්ෂණ හා සාකච්ඡා
- ව්‍යාපෘති හා සැලසුම් නිර්මාණ
- ප්‍රදර්ශන සංවිධානය කිරීම
- විවාද
- සාකච්ඡා
- සම්මන්ත්‍රණ
- ක්ෂණික කථා
- භූමිකා රංගන
- සාහිත්‍යමය වටිනාකමකින් යුත් ස්වනිර්මාණ ඉදිරිපත් කිරීම
- ක්ෂේත්‍ර චාරිකා හා සමීක්ෂණ
- නේවාසික ධර්ම විවේක හා ජනවන්දනාත්මක පිළිවෙත්
- සමාජ තලයට අවතීර්ණවීමට අවකාශය ලැබෙන ආකාරයේ ව්‍යාපෘති හා වැඩ සැලසුම්

## 5.0 පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

- අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක්වත් පාසල් මට්ටමින් නේවාසික ධර්ම විවේකයක් සංවිධානය කර සිසුන්ට ක්‍රියාකාරීව ඊට සම්බන්ධ කරවීම.
- එක් පාසල් අධ්‍යයන වාරයක් තුළ අවම වශයෙන් එක් වතාවක්වත් දිව්‍ය පූජා මෙහෙයකට පන්තියක් වශයෙන් සිසුන් සහභාගි කරවීම.
- සිසුන්ගේ අධ්‍යාත්මික වර්ධනය උදෙසා හැකි හැමවිටම මීසම භාර පියතුමන්ගේ, වෙනත් පියතුමන්ලාගේ, ගරු සහෝදරතුමන්ලාගේ සහ ගරු කන්‍යා සොහොයුරියන්ගේ සහය නොමදව ලබා ගැනීම.
- පාසල් මට්ටමින් සියලු සමිති සමාගම් ආරම්භ කර ඒවායේ සාමාජිකත්වය ලබාදීමෙන් සිසුන් තුළ යම් පිරිපුන් බවක් ඇති කිරීම.
- පාසල් සංස්කෘතිය හා බැඳි විවිධ මංගල්‍යයන් අර්ථවත් ලෙස සංවිධානය කිරීම, සැමරීම, හා ළමා රැළි, විෂය කඳවුරු ආදිය සංවිධානය කිරීම.
- කණ්ඩායම් ලෙස දේව වචනය කියවීම, අධ්‍යයනය කිරීම වැනි කටයුතුවලට සිසුන් යොමු කිරීම.
- පාසල තුළ ශිෂ්‍ය සුභසාධනය පිළිබඳ ධනාත්මක හැඟීම් ඇති කර අසරණයින්ට සහයවීමට ඔවුන් යොමු කිරීම.
- පාසල තුළ සහජීවනය හා සහෝදරත්වය වැඩි වර්ධනය කර ගනිමින් යහපත් පරිසරයක් ගොඩනැගීමට නිතර කැපවී කටයුතු කිරීම.
- දයා සේවාවන්හි නිරත වන සමිති සමාගම්වලට සහය දැක්වීම හා ඒවායේ සාමාජිකත්වය ලබා ගැනීමට කටයුතු කිරීම.

## 6.0 තක්සේරුව හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙල යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් - ඇගයීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිතය.

13 වන ශ්‍රේණිය අවසානයේදී ජාතික මට්ටමේ ඇගයීම වන අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිතය.

මෙම විෂය නිර්දේශය පදනම් කරගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමු වරට 2011 වර්ෂයේ දී පැවැත්වේ.

මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සැපයෙනු ඇත.